# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1879/19 - 2014 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

(නීතිය හා සාමය, මුදල් හා සැළසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන, වතු සුභසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය)

සබරගමුව පළාත් සභාවේ 2014 අංක 01 දරන සබරගමුව සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

2014.07.22 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2014.08.06 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ 2014 අංක 01 දරන සබරගමුව සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

2014.06.24 වන දින සභා සම්මත කරන ලදුව 2014.08.06 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2014 අංක 01 දරන සබරගමුව සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

ලලිත් දොඩම්කොටුව,<br>
සභා ලේකම්,<br>
සබරගමුව පළාත් සභාව.

2014 සැප්තැම්බර් මස 10 වැනි දින,<br>
සබරගමුව පළාත් සභාවේ දී ය.

**සබරගමුව පළාත් සභාවේ 2014 අංක 01 දරන සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනතේ 154 (උ) (1) වගන්තිය ප්‍රකාරව, සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව නමින් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් සංස්ථාපනය කිරීමට සහ සබරගමුව පළාත් සමුපකාර සේවකයින් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ සබරගමුව පළාත් සභාව විසින් සාදනු ලැබූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය 1992 අංක 51 දරන සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2014 අංක 01 දරන සබරගමුව සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබේ. ලුහුඬු නාමය

02. සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේය. ක්‍රියාත්මක වන දිනය

## I වන කොටස

### සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව සංස්ථාපනය, එහි බලතල හා කාර්යයන්

සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව සංස්ථාපනය කිරීම

03. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා මින් මතුවට කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවනු ලබන්නේ ය.

නීතිගත සංස්ථාවක් විය යුතු බව

04. කොමිෂන් සභාව අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර එය නෛතික සංස්ථාගත තත්ත්වයෙන් නඩු පැවරීමටත්, පවරනු ලැබීමටත්, මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය සියලු දේ කිරීමටත්, බලය ඇති නීතිගත සංස්ථාවක් විය යුතුය.

කොමිෂන් සභාවේ සංයුතිය

05. (1) කොමිෂන් සභාව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(2) යම් තැනැත්තෙක්,

(අ) සමුපකාර සමිතියක සේවකයෙකු හෝ හිටපු සේවකයෙකු වේ නම් ; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව සමුපකාර සේවකයින්ගේ වැටුප්, වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීමේ අරමුණු වශයෙන් පවත්වාගෙන යනු ලබන සේවක වෘත්තීය සමිතියක සාමාජිකයෙකුව සිටින තැනැත්තෙකු වේ නම් ; හෝ

(ඇ) සමුපකාර සමිති පිළිබඳ නීතිය අනුව සමුපකාර සමිතියක නිලධාරියෙකු වන යම් තැනැත්තෙකු වේ නම් ; හෝ

(ඈ) සිහි විකල් තැනැත්තෙකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු හෝ දණ්ඩ නීති සංග්‍රහය යටතේ නැතහොත් අල්ලස් පනත යටතේ වරදකරුවෙක් බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබ සිටින පුද්ගලයෙකු වේ නම් ; හෝ

(ඉ) තත් කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකයෙකු හෝ වශයෙන් ධූර දරන තැනැත්තෙකු වේ නම් ; හෝ

ඒ තැනැත්තා ඒ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීම සඳහා නුසුදුසු විය යුතුය.

සාමාජිකයන්ගේ ධූර කාලය

06. (1) අමාත්‍යවරයා විසින් ඉවත් නොකලහොත් හෝ මෙම ප්‍රඥප්තියේ 5(2) වගන්තිය අනුව නුසුදුස්සෙකු නොවුවහොත් හෝ සාමාජිකයෙකු සිය කැමැත්තෙන් ඉල්ලා අස් නොවුවහොත් හෝ සෑම සාමාජිකයෙකුම පත්කරනු ලැබූ දින සිට තුන් වසරක කාල සීමාවක් ස්වකීය ධූරය දැරිය යුතුය.

(2) යම් සාමාජිකයෙකු ස්වකීය ධූරයෙන් ඉවත් කරනු ලැබීම හෝ ඉල්ලා අස්වීම හෝ මරණය හේතු කොට ගෙන හෝ ඇතිවන පුරප්පාඩුවක් සඳහා පත් කරනු ලැබූ තැනැත්තෙකුගේ ධූර කාලය අන්‍ය නියමයක් නොකළහොත් ඒ අනෙක් සාමාජිකයන්ගේ ධූර කාලය අවසන් වන දිනයෙන් අවසන් වේ.

සභාපති හා කොමිෂන් සභාවේ කටයුතු පවත්වා ගෙන යාම.

07. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් එක් අයෙකු එහි සභාපති වශයෙන් පත්කළ යුතුය. සභාපති වරයා පැමිණ සිටින සෑම අවස්ථාවකදීම ඔහු කොමිෂන් සභා රැස්වීම් වල මුලසුන දැරිය යුතුය. සභාපතිවරයා නොපැමිණි විටදී පැමිණ සිටින සාමාජිකයින් අතරින් තෝරා ගනු ලබන එක් අයෙකු විසින් රැස්වීමේ මුලසුන ගත හැකිය.

(2) කොමිෂන් සභා රැස්වීම් වල ගණපූර්ණය සඳහා එහි සාමාජිකයින් දෙදෙනෙකු පැමිණ සිටීම ප්‍රමාණවත් වේ.

(3) සාමාජිකයින් දෙදෙනකු පමණක් පැමිණ සිටින අවස්ථාවකදී යම් කරුණක් පිළිබඳව තීරණයක් ගත නොහැකි වූ විටක ඒ කරුණ කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින රැස්වීමකට ඉදිරිපත් කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින රැස්වීමකදී යම් කරුණක් පිළිබඳව ගත යුතු තීරණය සම්බන්ධයෙන් ඒ සාමාජිකයන් අතර වන මතය වෙනස් වන්නේ නම්, වැඩි දෙනාගේ මතයට අනුව තීරණයකට එළඹිය යුතුය. එහෙත් සාමාජිකයින් සමානව බෙදුනහොත් සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමි වේ.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයින් අතර පුරප්පාඩුවක් පැවතීම නිසා හෝ පත්කිරීම සම්බන්ධයෙන් වන අඩුපාඩුවක් නිසා හෝ ඒ කරුණ හේතුකොට ගෙන කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ හෝ කරනු ලබන නියෝග හා විධාන කිසිවක් නිර්බල නොවන්නේය. නැතහොත් නිර්බල වන්නා සේ නොසැළකිය යුත්තේය.

(6) ස්වකීය කාර්යය පටිපාටි සකස් කර ගැනීම පිළිබඳ ඉහත සඳහන් කරුණු වලින් ආවරණය නොවන්නා වූ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය වන විධි විධාන සකස් කර ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත්තේය.

08. සබරගමුව පළාත් සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාවේ සභාපතිට සහ එහි සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ දීමනා අමාත්‍යවරයා විසින් නියම කළ යුතු වන්නේය. සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවීම

09. (1) කොමිෂන් සභාවට ලේකම්වරයෙකු විය යුතු අතර ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිළධාරියෙකු විය යුතුය. ලේකම් සහ සෙසු නිලධාරීන්

(2) කොමිෂන් සභාවේ සෙසු කාර්යය මණ්ඩලය පළාත් රාජ්‍ය සේවකයින් අතුරින් පත් කළ යුතුය. මෙම සේවකයින් පළාත් රාජ්‍ය සේවය අදාළ පරිපාලන හා විනය නියමයන්ට යටත් විය යුතුය.

10. (1) කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ තැනැත්තන් ස්වකීය ධූරයේ කාර්යයන් ආරම්භ කිරීමට මත්තෙන් මෙම ප්‍රඥප්තියේ සඳහන් උපලේඛන අංක 1 ආකෘතියෙහි වූ ප්‍රකාර දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් හෝ දිය යුතුය. කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ සෙසු නිලධාරීන් දිවුරුම් දීම.

(2) කොමිෂන් සභාවේ ලේකම් හා කාර්යය මණ්ඩලයේ සෙසු නිළධාරීන් කොමිෂන් සභාවේ සභාපති වරයා ඉදිරියේදී මෙම ප්‍රඥප්තියේ සඳහන් උපලේඛන අංක 2 ආකෘතියේ ප්‍රකාර දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් හෝ දිය යුතුය.

11. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතුය. කොමිෂන් සභාවේ බලතල

(අ) සමුපකාර සමිති වල සියලුම සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීමට අදාළ සේවා කොන්දේසි හා මූලධර්ම ඇතුළත් කාර්යය පටිපාටි නියම කිරීම ; එකී කාර්යය පටිපාටියට පරිභාහිරව හෝ උල්ලංඝනය කරමින් කරනු ලබන සියලුම බඳවා ගැනීම් හා පත් කිරීම් නීත්‍යානුකූල නොවන අතර එබඳු සේවකයන්ට ගෙවනු ලබන වැටුප්, දීමනා හා පාරිශ්‍රමික අදාළ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධිභාරයක් විය යුතු බවට නියෝග කිරීම ;

(ආ) අවශ්‍ය විටක සමුපකාර සමිති සේවකයින් බඳවා ගැනීමට අදාළ විභාග පැවැත්වීම හා එබඳු විභාග පැවැත්වීමේ මණ්ඩල නම් කිරීම හා එබඳු විභාග සඳහා වන ගාස්තු නියම කිරීම ;

(ඇ) කොමසාරිස්වරයා විමසා එවැනි යම් තනතුරකට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම, යම් පන්තියක හෝ වර්ගයක එවැනි යම් තනතුරකට හෝ තනතුරු වලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රම නියම කිරීම, ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම හෝ සකස් කිරීම හා සමුපකාර සේවකයින්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි නිශ්චය කිරීමේදී කොමිෂන් සභාවට සහාය වීම පිණිස කොමිෂන් සභාව විසින් අවශ්‍යයැයි සැළකිය හැකි උපදේශක කාර්යය සංවිධාන පිහිටුවීම ;

(ඈ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙසට සමුපකාර සමිති වලට නියම කිරීම ;

(ඉ) සමුපකාර සමිති විසින් සිය සේවකයන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය නිශ්චය කිරීම, ඒවා පැවැත්වීම සඳහා බලතල නියම කිරීම හා නියම කරනු ලබන කාලසීමාවන් ඇතුළතදී විනය පරීක්ෂණයක් පවත්වා අවසන් කරන ලෙස සමිතිවලට නියෝග කිරීම ;

(ඊ) ඕනෑම සමුපකාර සමිතියක් විසින්ම ගනු ලබන විනයානුකූල නියමයන් හේතු කොට පැන නගින අභියාචනා විභාග කිරීම ;

(උ) සිය සේවකයින් පිළිබඳව සමුපකාර සමිති විසින් ලබා ගත යුතු වාර්තා කවරේදැයි නියම කිරීම ;

(ඌ) ඕනෑම සේවකයෙකු පිළිබඳව කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපි ගොනු වෙනත් ලේඛන හා විස්තර වාර්තා නියමිත දිනට කලින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සහ සපයන ලෙස ඕනෑම සමිතියකට නියම කිරීම ;

(එ) කොමිෂන් සභාව විසින් යොමු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා නිර්දේශ සහිතව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට අභියාචනා පරීක්ෂක නිලධාරීවරයෙකු හෝ නිලධාරී මණ්ඩල නම් කිරීම ;

(ඒ) තමාගේ ක්‍රියා කලාපය විනය පරීක්ෂණයක විෂය කාරණයක්ව පවතින යම් සමිතියක ඕනෑම සේවකයෙකු විසින් එම සමිතිය දුන් විනය නියෝගයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනා කොට ඇති අවස්ථාවක එවැනි අභියාචනයක් සලකා බලා සමිතිය විසින් කරන ලද තීරණය වෙනස් කිරීමට, ලිහිල් කිරීමට, අවලංගු කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් තීරණයක් ගැනීමට හෝ නැවත පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝග කිරීමට හෝ එවැනි සේවකයෙකු නැවත සේවයට ගැනීම ඇතුළුව කොමිෂන් සභාව විසින් දෙනු ලබන නියෝග හා ඒවායේ සඳහන් වන ආකාරයට හා දිනකදී නැතහොත් නියම කරනු ලබන දිනකට පූර්වයෙන් ක්‍රියාත්මක කරන ලෙසට සමුපකාර සමිතියට නියෝග කිරීම ;

(ඔ) විනය කාර්යයක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සේවකයෙකුගේ සේවය අවසන් කිරීමකදී අවශ්‍ය වන්නේ නම් පාරිතෝෂික, වන්දි හෝ වෙනත් ප්‍රතිලාභ සේවකයින්ට ලබා දීම පිළිබඳව ප්‍රතිපත්ති තීරණය කිරීම ;

(ඕ) අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි මගින් නියම කරනු ලබන යම් මුදලක් තැන්පත් කරන ලෙස අභියාචනාකරුට නියම කිරීමට සහ අභියාචනා පරීක්ෂණය අවසානයේදී එකී තැන්පත් මුදල රඳවා ගැනීමට හෝ ආපසු ගෙවීමට තීරණය කිරීම ;

(2) (1) වන වගන්තියේ (ඊ), (ඒ), (ඕ) යන ජේදවල විධිවිධාන හැර අනෙකුත් ජේදවලින් කොමිෂන් සභාව වෙත පැවරුණ බලතල ක්‍රියාවෙහි යෙදවීමේදී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ හෝ නියෝග කිරීම් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට කොමිෂන් සභාවට කළ හැකිය.

මූල්‍ය ප්‍රතිපාදන

12. සමුපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභාව විසින් වාර්ෂිකව වෙන් කර දිය යුතුය.

## II කොටස

### සමුපකාර සමිති හා ඒවායේ කාර්යය මණ්ඩල

සමුපකාර සමිතියක් සේවා යෝජකයෙකු විය යුතු බව.

13. යම් සේවකයෙකු වෙනුවෙන් වැටුප් හෝ වෙනත් පඩි නඩි ගෙවනු ලබන සමුපකාර සමිතියක් එම සේවකයාගේ සේවායෝජකයා ලෙස සලකනු ලැබිය යුතුය.

සමුපකාර සමිති සේවකයන්ගේ වැටුප්

14. සෑම සමුපකාර සමිතියක්ම එහි අරමුදලින් එම සමිතියේ සේවකයන්ගේ වැටුප් හා අනෙකුත් දීමනා ගෙවිය යුතුය.

සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ නියෝග වලට යටත් විය යුතු බව.

15. ඕනෑම සමුපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයෙකු වුවද එකී සියළු සේවකයන් මෙම ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි නියෝගයන්ට යටත් විය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ නියෝගයන් හා බලතල ඉටු කිරීමෙහිලා හා ක්‍රියාවෙහි යෙදවීමෙහිලා කෙරෙන කොමිෂන් සභාවේ සියළු තීරණ හා 11(2) වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව කරනු ලබන නියෝග අවසානාත්මක විය යුතු අතර, සියළු සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ විධිවිධාන පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

කොමිෂන් සභාවේ නියෝග වලින් සමුපකාර සේවකයන් බැඳෙන බව

16. යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියළු නියෝග 11(2) වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව අවසානාත්මක විය යුතු අතර ඒ නියෝග සමිතිය විසින් කරන ලද්දක් පරිද්දෙන් ඒ සේවකයා විසින් පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය නිසා ඇතිවන වෙනස් කම්

17. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවන දිනට හෝ ඊට පූර්වයෙන්, 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ ප්‍රතිෂ්ඨාපිත සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් මෙන්ම සබරගමුව පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනත සමග කියවෙන 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ ප්‍රතිෂ්ඨාපිත සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සබරගමුව පළාත් සමුපකාර සමිති හා සේවකයන් විෂයෙහි, ක්‍රියාත්මක පරිදි,

(අ) නිශ්චය කරන ලද වැටුප් ක්‍රම හා සේවා කොන්දේසි ඇතුළු සියලුම වර්ග කිරීම් ;

(ආ) එම පනතේ කාර්යයන් ඉටුකිරීමෙහිලා නිකුත් කරන ලද සියලු ආකාරයේ විධානයන් ;

(ඇ) භාරගන්නා ලද සියලුම ආකාරයේ අභියාචනා විභාග කිරීමට ආරම්භ කරන ලද හා විභාග නිම කොට නියෝග නිකුත් කිරීමට අදාළ සියලු අභියාචනා ;

(ඈ) ආරම්භ කරන ලද සියලුම ආකාරයේ නීති කෘත්‍යයන් ;

(ඉ) පනවන ලද සියලු රෙගුලාසි සහ නිකුත් කරන ලද චක්‍ර ලේඛ විධිවිධානයන් ;

(ඊ) කරන ලද සියලුම පත්කිරීම් සහ උසස් කිරීම් ;

මෙම ප්‍රඥප්ති යටතේ සිදුකරන ලැබූ පරිද්දෙන් නීතිමය බලය සහිතව වලංගුව බල පැවැත්විය යුතුය.

(2) 2011 ජූලි 02 දින අංක 1712/36 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි (සමුපකාර සේවක ආයතන සංග්‍රහය) සබරගමුව පළාත් සමුපකාර අමාත්‍යවරයා මගින් රෙගුලාසි සම්පාදනය කරන තෙක් වලංගුව පවතිනු ඇත.

පදිංචිය පිළිබඳ සුදුසුකම්

18. සමුපකාර සමිතියක ඕනෑම තනතුරක් සඳහා බඳවා ගත යුත්තේ සබරගමු පළාත ඇතුළත ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු පමණි. එසේ වුවද කොමිෂන් සභාවේ මතය අනුව යම් සමුපකාර සමිතියක එවැනි තනතුරක් සඳහා සුදුසුකම් ඇති අයෙකු සබරගමුව පළාත ඇතුළතින් තෝරා ගැනීමට අපහසු වුවහොත්, අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි වල සඳහන් නියමයන්ට යටත්ව සමිතිය විසින් එකී කොමිෂන් සභාවට දැන්වීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ අනුමැතිය මත එම පළාත තුළ ස්ථිර පදිංචිය නොමැති වුවද සුදුසුකම් ඇති අයෙකු පත් කර ගැනීමට සමුපකාර සමිතියට බලය තිබිය යුතුය.

සමුපකාර සමිතියක වර්ගය හා සේවකයන්ගේ වර්ගය හා පන්තිය අනුව සේවක වැටුප් ක්‍රම නිශ්චය කළ යුතු බව

19. සමුපකාර සමිතියක යම් තනතුරකට පත්කරනු ලබන ඕනෑම තැනැත්තකු එම තනතුරට අදාළ වූ වැටුප් ක්‍රමයක පිහිටු විය යුතුය. එය 27(1) වන වගන්තියේ සඳහන් ආකාරයට සමිතියේ වර්ගයට අනුව නිශ්චය කරනු ලබන සේවක වර්ගයට සහ පන්තියට අදාළ වන පරිදි තීරණය විය යුතුය.

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙන් ද්විතියනය කිරීම

20. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වල කුමක් සඳහන් වුවද පත්කිරීමේ බලධාරියාගේ එකඟත්වය සහ අදාළ නිලධාරියාගේද, විෂයය භාර අමාත්‍යවරයාගේද එකඟතාවය ඇතිව පළාත් රාජ්‍ය සේවයෙන් ද්විතියනය කරන ලද නිලධාරියෙකු සමිතියක යම් තනතුරකට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමාවක නියමයන්ට හා කොන්දේසි වලට යටත්ව පත්කිරීමට කොමිෂන් සභාවට හැකිය.

මෙම වගන්තියේ කාර්යයන් සඳහා පත්කිරීමේ බලධාරියා යනුවෙන් අදහස් කරනුයේ පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීමේ බලධරයා වේ.

සේවක ඇප මුදල

21. (1) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වැඩි මුදලක් ඇප වශයෙන් තබන ලෙස සමුපකාර සමිතියක් විසින් යම් සේවකයෙකුට නියම නොකළ යුතුය.

(2) සමුපකාර සමිතියක යම් සේවකයකු විසින් තබන ලද මුදලින් වූ යම් ඇපයක් සමිතියේ නමින් බැංකුවක තැන්පත් කළ යුතු අතර, එයට අයත් වන යම් පොළියක් ඒ සේවකයාට ගෙවිය යුතුය.

සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

22. (1) සේවා යෝජකයෙකු වූ සෑම සමුපකාර සමිතියක්ම හා ඒ සමිතියේ සෑම සේවකයෙකුම විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි යම් මුදලක් වාර පතා දායක මුදල් වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතුය.

සේවක පාරිතෝෂික දීමනා

(2) විශ්‍රාම යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, සේවයෙන් පහ කිරීමෙන්, සේවය අතහැර යාමෙන් හෝ වෙනත් මොනයම් ආකාරයෙන් හෝ සේවය අවසන් කරනු ලබන සමුපකාර සේවකයෙකු අඛණ්ඩ වසර 05 ක කාලයක් සේවය සම්පූර්ණ කර තිබේනම් ඔහුට හෝ ඇයට පාරිතෝෂික දීමනා ගෙවිය යුතුය.

සමුපකාර සේවකයින් කොමිෂන් සභාවේ නොව සමිතියේ සේවකයින් බව

23. සේවයට ගන්නා ලද සියලු සේවකයන් ඔවුන් සේවයට ගන්නා ලද්දේ යම් සමිතියක් විසින් ද ඒ සමිතියේ සේවකයන් බව ඒ සමිතියේ සේවයෙහි නියුක්ත බව හා ඒ සමිතියට පක්ෂපාතී විය යුතු බව සැකදුරුවීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

සමුපකාර සේවකයින් සේවයෙන් පහ කිරීම හෝ දඬුවම් පැමිණවීම

24. (1) සමුපකාර සේවකයෙකු සේවයෙන් පහ කිරීමට හෝ අන් ආකාරයක දඬුවමක් කිරීමට මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සැලකෙන හෝ රෙගුලාසි වලට අනුව මිස නොකළ යුතුය.

(2) මෙම වගන්තියේ සඳහන් විධිවිධාන කිසිවකින් මෙම කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමේ දිනයට පෙර සිදුවූ නැතහොත් උද්ගත වූ යම් විෂමාචාරයක් හෝ විනය කඩ කිරීමක් හෝ වෙනත් පැමිණිලි නිමිත්තක් හෝ සම්බන්ධයෙන් යම් සමුපකාර සේවකයෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට, මේ විධිවිධාන අනුව පවත්වාගෙන යාමට හා අවසන් කිරීමට බාධාවක් ඇති නොවන්නේය.

(3) විධිමත් පරිදි විනයානුකූලව කටයුතු කිරීමකින් තොරව කිසියම් සේවකයෙකුට දඬුවම් නියම කිරීමට එරෙහිව එම සේවකයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයකදී හෝ ඊට සම්බන්ධ නීති කෘත්‍යයකදී සේවකයාට වන්දි, හිඟ වැටුප්, දඩ මුදල් හෝ වෙනත් මුදලක් සමිතියෙන් ගෙවීමට සිදුවුවහොත් ඊට වගකිවයුතු කාරක සභාවේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විසින් තනි තනිව සහ එකමුතුව එකී මුදල සමිතියට ප්‍රතිපූරණය කිරීමේ වගකීමට බැඳී සිටිය යුතුය.

සේවකයන්ට අදාල රෙගුලාසි

25. (1) පහත සඳහන් ආකාරයේ එනම්,

(අ) සමුපකාර සමිතිවල සේවකයන් වර්ග කිරීම්, ශ්‍රේණි හා පන්ති නියම කිරීම්, බඳවා ගැනීම්, පත් කිරීම්, කාර්යය සාධනය ඇගයීම්, පුහුණු කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, ඉල්ලා අස්වීම්, සේවය අවසන් කිරීම් හා සේවක දුක් ගැනවිලි පිළිබඳව ;

(ආ) සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් සේවකයන්ට වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික ගෙවීම, සේවක සුභසාධනය, අත්තිකාරම්, ප්‍රදානයන්, නිවාඩු, විනය ක්‍රියාවලිය හා අභියාචනා පිළිබඳව ; සහ

(ඇ) සේවා නියමයන් සහ කොන්දේසි වලට අදාල හා අවශ්‍ය වෙතැයි සැලකෙන වෙනත් කරුණු පිළිබඳ අමාත්‍යවරයා විසින් රෙගුලාසි සාදනු ලැබිය හැකිය.

(2) සබරගමුව පළාත් සභා බල සීමාව තුල පිහිටි සියළුම සමුපකාර සමිති සහ ඒවායේ සේවකයින් මෙහි (1) වන උප වගන්තියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් පනවනු ලබන සෑම රෙගුලාසියකින්ම බැඳී සිටිය යුතුය.

සිය සේවකයින් සම්බන්ධ සමුපකාර සමිති වල කාර්යය භාරයන්

26. (1) සෑම සමුපකාර සමිතියක් විසින්ම -

(අ) එහි සෑම සේවකයෙකු සම්බන්ධයෙන්ම කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ලේඛන හා වාර්තා තබා ගත යුතු අතර, එක් එක් සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයට අදාල අවශ්‍ය සියළු විස්තර ඒවායෙහි ඇතුලත් කල යුතුය ;

(ආ) කොමිෂන් සභාව විසින් සේවකයින් පිළිබඳව සැපයිය යුතු යැයි නියම කරනු ලැබිය හැකි වාර්තා, තොරතුරු සහ විටින් විට කොමිෂන් සභාවට අවශ්‍ය වෙතැයි නියම කරනු ලැබිය හැකි ආකාරයට තොරතුරු සැපයිය යුතුය ; තවද,

(ඇ) එම සමිතියේ කාර්යාල වලින් යම් කාර්යාලයකට ඇතුළු වී, එහි පවත්වාගෙන යනු ලබන පොත්පත්, ගිණුම් වාර්තා සහ ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ඒවායේ පිටපත් ලබා ගැනීමටද, අභියාචනයක හෝ විනය පරීක්ෂණයකදී යම් සාධාරණ හා යුක්ති සහගත නියමයන්ට එළඹීම පිණිස අවශ්‍ය වෙතැයි හැඟෙන භාණ්ඩයක් තොග ගබඩාවක් හෝ වෙනත් යම් ස්ථානයක් හෝ වත්කමක් පරීක්ෂා කර බැලීමටද ඒ සඳහා බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ සාමාජිකයෙකුට හෝ නිලධාරියෙකුට හෝ සේවකයෙකුට හෝ එසේ කිරීමට ඉඩ දිය යුතුය.

## III කොටස

### සමුපකාර කොමසාරිස්වරයාගේ බලතල

කොමසාරිස්වරයා විසින් සමිති වර්ග කල යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කල යුතු බව

27. (1) සමුපකාර සමිති වල තනතුරු සඳහා වැටුප් ක්‍රම නියම කිරීමේ කාර්යය සඳහා සමුපකාර සමිති වර්ග කිරීමටද ඒ සමිතිවල සේවක වර්ග සහ පන්ති සහ එක් එක් වර්ගයේ සහ පන්තියේ සිටිය යුතු සේවකයින්ගේ සංඛ්‍යාව නියම කිරීමේ හා අවශ්‍ය වෙතැයි තමා සලකන පරිදි විටින් විට වෙනස්කම් කිරීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතුය.

(2) ඉහත (1) වන උප වගන්තිය අනුව, කොමසාරිස්වරයා විසින් කරනු ලබන නියමයකට පටහැනි වන පරිදි කිසිම සමුපකාර සමිතියක් විසින් කිසිම තැනැත්තකු සේවයට බඳවා ගැනීම නොකල යුතුය.

28. කොමිෂන් සභාව විසින් සමුපකාර සමිති වල යම් තනතුරකට පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීමද, යම් පන්තියක හෝ යම් ශ්‍රේණියක යම් තනතුරකට හෝ තනතුරු වලට අනුයුක්ත කල යුතු වැටුප් ක්‍රම නියම කිරීමටද, ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීමද, කොමසාරිස්වරයාගේ එකඟත්වය ඇතිව කළ යුතුය. සුදුසුකම් වැටුප් ක්‍රම ආදිය පිළිබඳ කොමිෂන් සභාව කොමසාරිස්වරයාගේ එකඟත්වය ලබා ගත යුතු බව.

## IV වන කොටස

### විවිධ විධිවිධාන

29. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී එමගින් විධිවිධාන සලස්වා නොමැති හෝ ක්‍රියාත්මක විධිවිධාන සලස්වා නොමැති හෝ කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවයක් හෝ උද්ගත වුවහොත් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් ඒ දුෂ්කරතාවය හෝ සැකය ඉවත් කල හැකිය ; නැතහොත් තීරනයක් කල හැකිය. එවැනි නියෝගයක් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව ඊට නීතිමය බලය තිබිය යුතු අතරම මෙම ප්‍රඥප්තියෙහි ඇතුලත් කොට පනවනු ලැබුවාක් මෙන් වලංගුව හා බලාත්මකව පැවතිය යුතුය. දුෂ්කරතා ඉවත් කිරීම

30. (1) ප්‍රකාශිතවම අන් ආකාරයක විධිවිධාන සලස්වන ලද්දේ නම් මිස, නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය යටතේ බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් ද ඒ සියළු කරුණු සහ නියම කල යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් ප්‍රකාශ කර හෝ නියම කර ඇති සියළු කරුණු සඳහා වූ නියෝග ඇතුළුව, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි ප්‍රතිපත්ති බල ගැන්වීම සඳහා අවශ්‍ය වන කොමිෂන් සභාවට පැනවිය හැකි සියලු නියෝග කොමිෂන් සභාව විසින් සෑදිය හැකිය. අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය හැකි බව.

(2) එවැනි කිසිම නියෝගයක්, අමාත්‍යවරයා විසින් එය අනුමත කරනු ලබන තුරු හා ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තුරු බල නොපැවැත්විය යුතුය.

(3) යම් නිවේදනයක් (2) වන උප වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට ඒ නියෝගය, එය මෙහිලා සාදනු ලැබුවාක් මෙන් වලංගුව පැවැත්විය යුතුය.

31. ගන්නා ලද තීරණයක් හෝ කරන ලද හෝ නොකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභා සාමාජික තත්ත්වයෙන් ඒ තැනැත්තාට හෝ නීති ගත සංස්ථා තත්ත්වයෙන් කොමිෂන් සභාවට හෝ විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වා ගෙන යාම නොකල යුතුය. කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ මුක්තීන්

32. මෙම ප්‍රඥප්තියේ විධි විධානවල කුමක් සඳහන් වුවද, යම් සමුපකාර සමිතියක් එහි කාර්යක්ෂමතාවය උදෙසා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව, කොන්ත්‍රාත් හෝ දෛනික පඩි ගෙවීමේ පදනම මත සේවකයින් බඳවා ගැනීම

(අ) කොන්ත්‍රාත් පදනමින් නිශ්චිත සේවා කොන්දේසි වලට අනුකූලව ප්‍රවීනයෙකු හෝ විශේෂඥයෙකු සේවයට බඳවා ගත හැකිය.

(ආ) අනියම් හෝ දවස් පඩි හෝ පැය පඩි ගෙවන සේවකයින් හෝ කෑලි ක්‍රමයට ගෙවන සේවකයින් සේවයේ යොදවා ගත හැකිය.

(ඇ) විශේෂිත අවස්ථාවලදී පමණක් මාස 06 ක උපරිමයකට යටත්ව යම් තනතුරකට වැඩ බැලීමේ පදනම මත සේවකයන් සේවයේ යොදවා ගත හැකිය.

එසේ වුවද කොමිෂන් සභාවේ එකඟත්වය නැතිව එවැනි සේවකයින්ට සේවා ස්ථිරත්වයක් ලබා නොදිය යුතුය.

33. (1) (අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන කඩ කරන හෝ ; වැරදි

(ආ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් නියෝගයක් ඕනෑකමින් නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ මෙම ප්‍රඥප්තියේ අවශ්‍යතාවයන්ට අනුව කොමිෂන් සභාවට හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන්‍ය තැනැත්තෙකුට හෝ සපයන ලෙස නියම කරනු ලබන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින්ම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ

(ඇ) අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කරන හෝ යම් සමුපකාර සමිතියක් හෝ කාරක සභාවක් හෝ යම් නිලධාරියෙකු හෝ යම් සේවකයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක් හෝ සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රු.5000.00 කට නොවැඩි දඩයක් හෝ මාස 06 කට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමකට හෝ යන දඬුවම් දෙකෙන් එකකට නැතහොත් එකී දඬුවම් දෙකටම යටත් කිරීමට හැකිය.

(3) යම් සේවකයෙකු නැවත සේවයේ පිහිටුවන ලෙස හෝ එබඳු ඕනෑම නියෝගයක් හෝ කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ විට එබඳු නියමයන්ට අනුව කටයුතු කිරීම පැහැර හැරීම හේතුකොට ගෙන යම් සමුපකාර සමිතියක් වරදකරු කරනු ලැබූ විටක එවැනි සමුපකාර සමිතියක්,

(i) (2) වන උප වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි දඬුවමකට අතිරේකව ඒ වරද කරනු ලැබීමෙන් පසු ඒ පැහැර හැරීම ඉදිරියටත් පවත්වා ගෙන යන එක් එක් දිනයක් පාසා එක් එක් දිනය වෙනුවෙන් රු.250.00 බැගින් වූ දඩ මුදලක් ගෙවීමටද යටත් වන අතර,

(ii) කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූලව එසේ සේවකයා නැවත සේවයෙහි පිහිටුවිය යුතු දින සිට අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වන දින දක්වා කාලයට ඒ සේවකයාගේ සේවය අවසන් නොකොට දිගටම සේවයෙහි රඳවා සිටියේ යැයි සලකා ඔහුට හිමිවිය යුතු වැටුප් හා වෙනත් දීමනා සියල්ල ගෙවීමටද බැඳී සිටිය යුතුය.

(iii) යම් සේවකයෙකුට වැටුපක් හෝ අන් ආකාරයක දීමනාවක් හෝ වන්දියක් හෝ ගෙවන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබ ඇති විට එම ගෙවීම පැහැර හරින ලද යම් සමිතියක් වරදකරු කරනු ලැබූ විටක ඉහත (2) වන උප වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි දඬුවමකට අතිරේකව කොමිෂන් සභාව නියම කොට ඇති මුදලද ගෙවීමට බැඳී සිටිය යුතුය.

මෙම උප වගන්තියේ (ii) හා (iii) ජේද යටතේ සමුපකාර සමිතිය ගෙවීමට යටත් වන මුදල ඒ සමිතිය වරදකරු කරනු ලැබූ උසාවිය විසින් පනවනු ලැබූ දඩයක ස්වරූපයෙන් එම උසාවියේ ආඥාවක් අනුව අය කරනු ලැබිය හැකිය. ඒ අය කරන මුදල සේවකයාට ගෙවිය යුතුය.

කොමිෂන් සභාවට බලපෑම් කිරීම

34 ස්වකීය රාජකාරි ඉටු කිරීමේදී හැර ඍජුව හෝ වක්‍රාකාරයෙන් හෝ අන් තැනැත්තෙකුගේ මාර්ගයෙන් හෝ කවර ආකාරයෙන් හෝ කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි යම් කිසි සාමාජිකයෙකුට යම් බලපෑමක් කරනු ලබන හෝ කිරීමට තැත් කරන හෝ සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රු.5000කට නොවැඩි දඩයක් හෝ මාස 06 කට නොවැඩි කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයකට සිර දඬුවමකට හෝ යන දඬුවම් දෙකෙන් එකකට නැතහොත් එකී දඬුවම් දෙකටම යටත් කිරීමට හැකිය.

අනුමැතියක් රහිතව තොරතුරු හෙළිදරව් කිරීම නොහැකි බව

35 කොමිෂන් සභාවේ සාමාජිකයෙකු, එහි ලේකම්, එහි කාර්යය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අන් කිසි තැනැත්තෙකු විසින් ස්වකීය නිල කාර්යයන් ඉටු කිරීමේ අවස්ථාවන්වලදී හැර සිය රාජකාරි කටයුතු වලදී තමාට දැන ගන්නට ලැබෙන ලේඛනයක හෝ යම් සංදේශයක හෝ ඇතුලත යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම නොකල යුතුය.

කොමිෂන් සභාවේ සංදේශනයක් වරප්‍රසාද වලින් යුක්ත බව

36 කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු සහ යම් සමුපකාර සමිතියක් හෝ ඒ සමිතියේ කාරක සභාවේ සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හෝ සාමාජිකයෙකු අතර, කොමිෂන් සභාවේ නිල කාලයන් ඉටු කිරීම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික සංදේශයක අන්තර්ගත යම් කරුණක් යම් නීති කෘත්‍යයකදී හෙළිදරව් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවේ සභාපතිවරයා ලියවිල්ලකින් අනුමැතිය දී ඇතොත් විනා කිසිම තැනැත්තෙකුට අවසර නොතිබිය යුතුය.

සමුපකාර සමිති සහ ඒවායේ සේවා නියුක්තියන් සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනත අදාල වීම

37 (1) කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත යම් සේවා නියුක්තයෙකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 31 (ආ) වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරාණුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් කොමිෂන් සභාව විසින් භාර නොගත යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ යම් සේවා නියුක්තයෙකු විසින් කොමිෂන් සභාවට යම් කරුණක් සම්බන්ධයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරාණුකූලව එම කරුණ සම්බන්ධයෙන් එම සේවා නියුක්තයාට කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට බලයක් නොතිබිය යුතුය.

38 මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

39. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ "අමාත්‍යවරයා" යන්නෙන්

අර්ථ නිරූපණය

සබරගමුව පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයාද,

"කාරක සභාව" යන්නෙන්

ලියාපදිංචි කල සමුපකාර සමිතියක කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය භාර කරනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩල අදහස් වන අතර, ලියාපදිංචි කල සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හා කොමසාරිස්වරයා විසින් පත් කරන ලද තැනැත්තන්ද ඊට ඇතුලත් වේ.

"කොමසාරිස්වරයා" යනුවෙන්

සබරගමුව පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්ද,

"නිලධාරියා" යන්නෙන්

යම් සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් සඳහන් කෙරෙන සෑම අවස්ථාවකදීම එම පදයෙන් සමුපකාර සමිතියක කාරක සභිකයින්, ලේකම් විධායක නිලධාරීන්ද,

"සමුපකාර සමිතිය" යන්නෙන්

සමුපකාර සමිති වලට අදාල නීති යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක්ද,

"සේවකයා" යන්නෙන්

මෙම ප්‍රඥප්තියේ අර්ථානුකූලව සමුපකාර සේවකයෙකුද අදහස් කරනු ලැබේ.

*උපලේඛන අංක - 01*

*සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජිකයෙකු විසින් 10(1) වන වගන්තිය ප්‍රකාරව දිවුරුම් දීම/ප්‍රතිඥා දීම*

සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික වශයෙන් පත් කරනු ලැබ සිටින.................................................................... වන මම, මා වෙත පැවරී ඇති සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික ධූරයට අයත් කාර්යයන් භයින් හෝ පක්ෂපාතීත්වයෙන්ද, දයාවෙන්ද, හෝ ද්වේෂයෙන්ද තොරව සම්පූර්ණයෙන් යුක්තිය හා සාධාරණය ඉටු කරන බවටත්, මගේ නිල කාර්යයන් ඉටු කිරීමේදී ඉහත ධූරයට අයත් කාර්යයන් සම්බන්ධයෙන් වූ කවර කරුණක් පිළිබඳව හෝ සෘජුවම නැතහොත් වක්‍රාකාරයකින් හෝ කුමන පුද්ගලයෙකුට වුවද හෙළිදරව් නොකරන බවටත්, අවංකවද, ගාම්භීර පූර්වකවද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි./ප්‍රතිඥා දෙමි.

..................................

අත්සන

20 ..... ක්වූ .................. මස ........... දින,
දී මා ඉදිරිපිටදී දිවුරුම් දෙන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

........................................

සබරගමුව පළාත්බද මහාධිකරන විනිසුරු

*උපලේඛන අංක - 02*

*සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු විසින් 10(2) වන වගන්තිය ප්‍රකාරව දිවුරුම/ප්‍රතිඥාව*

සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු වශයෙන් එකී ධූරයේ කාර්යයන් කිරීමට නියම කරනු ලැබ සිටින.................................................................... වන මම, සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරී තනතුරට අයත් කාර්යයන් ඉටු කිරීමේදී හැර අන් කවර විටකදී වුවත් එකී තනතුරේ කටයුතු කිරීමේදී මට දැන ගැනීමට ලැබෙන්නාවූ ලේඛනයක, සංදේශයක හෝ තොරතුරු අන්තර්ගත කරුණු සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ සෘජුවම නැතහොත් වක්‍රාකාරයකින් කුමන පුද්ගලයෙකුට වුවත් අනාවරනය නොකරන බවට, අවංකවද, ගාම්භීර පූර්වකවද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි./ප්‍රතිඥා දෙමි.

..................................
අත්සන

20 ..... ක්වූ .................. මස ........... දින,
දී මා ඉදිරිපිටදී දිවුරුම් දෙන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

.........................................
සභාපති,
සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව.

09 - 1139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.